ආයතනයේ නම	:	මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හතක්.*
පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක	:	488

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர்	:	**நிதிஇ திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சின் கீழ் உள்ள ஏழு திணைக்களங்கள்.**
பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்	:	**488**

பாராளுமன்ற பொது கணக்கு குழுவால் பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கப்பட்ட அறிக்கை தொடர்பாக கௌரவ நிதி திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சர் அவர்களால் நிலையியல் கட்டளை இலக்கம் 119(4)-இன் கீழ் எடுக்கப்பட்ட அவதானிப்புகள் மற்றும் நடவடிக்கைகள் சமர்ப்பிப்பு

Name of the Institution	:	**Seven Departments under The Ministry of Finance, Planning and Economic Development.**
Parliamentary Series	:	**488**

Submission of the observations and measures taken by Hon. Minister of Finance, Planning and Economic Development under Standing Order No. 119(4) regarding the report tabled by the Committee on Public Accounts of Parliament, to the Parliament

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01,
ශ්‍රී ලංකාව.

செயலகம், கொழும்பு 01.
இலங்கை.

The Secretariat, Colombo 01.
Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700

ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: MF06/10//PS/488

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2026.07.13

ගරු පාර්ලිමේන්තුවේ සභානායකතුමා මගින්
ගරු පාර්ලිමේන්තුවේ කථානායකතුමා
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට අදාළව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සහ ගනු ලැබූ පියවර ඉදිරිපත් කිරීම.
පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 488 රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ නව සංශෝධිත පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක 119(4) අනුව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල කටයුතු විමර්ශනය කිරීමෙන් අනතුරුව එම කමිටුව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවේ සඳහන් නිරීක්ෂණ/නිර්දේශ/නියෝග සම්බන්ධයෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

ඒ අනුව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරය තුල දී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනයට ලක් කරන ලද, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු පිළිබඳ විමර්ශන පදනම් කරගෙන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සම්පාදිත වාර්තාව පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා 488 හි අන්තර්ගත වේ. ඒ සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් මාගේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පිළිබඳ වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සම්පාදිත වාර්තාවේ අන්තර්ගත මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු වලට අදාල වන නිර්දේශ සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හතක් මගින් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුලත් කර ඇති බව ගරු පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කරමි.

අනුර කුමාර දිසානායක
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

* . මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හතක්.

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சின் கீழ் உள்ள ஏழு.

திணைக்களங்கள்..

Seven Departments under the Ministry of Finance, Planning and Economic Development

අංකය இல்லை No.	දෙපාර්තමේන්තුවේ නම / துறையின் பெயர் / Name of Department
01	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව/ **அரசிறைக் கொள்கைத் திணைக்களம்/** Department of Fiscal Policy
02.	වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව/ **வர்த்தக மற்றும் முதலீட்டுக் கொள்கைகள் திணைக்களம்** / Department of Trade and Investment Policies
03.	තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව / **தகவல் தொழில்நுட்ப முகாமைத்துவத் திணைக்களம்** / Department of Information Technology Management
04.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව/ **உள்நாட்டு இறைவரித் திணைக்களம்/** Department of Inland Revenue
05.	ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව/**இலங்கை சுங்கம்/** Sri Lanka Customs
06.	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව/ **இலங்கை மதுவரித் திணைக்களம்/** Excise Department of Sri Lanka
07.	ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව/ **இறக்குமதி மற்றும் ஏற்றுமதிக் கட்டுப்பாட்டுத் திணைக்களம்/** Import and Export Control Department

පටුන

අංකය	දෙපාර්තමේන්තුවේ නම	පිටු අංකය
1.	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව	08 – 11
2.	වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව	12 – 13
3.	තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව	14 – 15
4.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	16 – 37
5.	ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව	38 – 45
6.	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	46 – 47
7.	ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව	48 - 49

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : **488**

දෙපාර්තමේන්තුවේ නම : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ඉණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

අංකය	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශ	ආයතනය විසින් නිර්දේශ සඳහා ගනු ලැබූ පියවර/වර්තමාන තත්ත්වය
01	රාජ්‍ය ආදායම වර්ධනය කර ගැනීම සඳහා යෝජනාවලියක් ඉදිරිපත් කිරීම.	2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත 2024 වසරේදී බලාත්මක කිරීමෙන් අනතුරුව එහි 8(2) වගන්තිය ප්‍රකාරව ආදායම් කළමණාකරණ කමිටුවක් ස්ථාපනය කිරීමට කටයුතු කරන ලදී. මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ සහභාගිත්වයෙන් යුත් මෙම කමිටුව සාමාජිකයන් 09 දෙනෙකුගෙන් සමන්විත වේ. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුව මෙම කමිටුවෙහි ප්‍රධාන කාර්යභාරය වන්නේ රාජ්‍ය ආදායම එකතු කරනු ලබන ප්‍රධාන ආයතන අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම, එම ආයතනවල කාර්යසාධනය මනා සුපරීක්ෂණයට ලක් කිරීම සහ එම ආයතනවල දුර්වලතාවයන් මහහරවා ගනිමින් ආදායම් උත්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය මහපෙන්වීම සිදු කිරීමයි. මෙම කමිටුව තුළ සාමාජිකයන් ලෙස දේශීය අදායම් දෙපාර්තමේන්තුවේ, සුරාබදු දෙපාර්තමේන්තුවේ සහ රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්ද කටයුතු කරනු ලබයි. වසරේ සෑම කාර්තුවකදීම මෙම කමිටුව රැස්වන අතර එහිදී එක් එක් ආදායම් දෙපාර්තමේන්තුව විසින් සිය ඉදිරි සැලැස්ම, ඇස්තමේන්තුවට අදාලව මෙතෙක් අත්කර ගෙන ඇති ප්‍රගතිය, ආදායම් වර්ධනය කර ගැනීම සඳහා ඇති ගැටළු ආදීය සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ තීරණ ගනු ලබයි.
06	මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ හා අදාළ ආයතන අතර සම්බන්ධීකරණයේ දුර්වලතා	ඉහත 01 හි සඳහන් කළ පරිදි රාජ්‍ය ආදායම එකතු කරනු ලබන ප්‍රධාන ආයතන අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම, ආදායම් කමිටුවේ ප්‍රධාන කාර්යභාරයකි. ඒ අනුව මෙම යාන්ත්‍රණය යටතේ ආයතන අතර සම්බන්ධීකරණය මනාව තහවුරු කිරීමට හැකිවනු ඇත.

10	රාජ්‍ය ආයතනවල ආදායම් ඇස්තමේන්තු පසුව සංශෝධනය කිරීම මත ඇතිවන ගැටලු	2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත 2024 වසරේදී බලාත්මක කිරීමෙන් අනතුරුව 2025 වසරේ ජූනි මස 30 වන දින මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය 2026 ගරු මුදල් අමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවේදී නිවේදනය කිරීමෙන් අනතුරුව මුදල් අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරන ලදී.මෙහිදී යම් හේතුවක් මත රාජ්‍ය මූල්‍ය විවිලාය්‍යන්හි තත්‍ය අගයන් පුරෝකථනය කල අගයන්ට වඩා සැලකිය යුතු අපගමනයක් දැක්වෙන්නේ නම් ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට කරුණු දැක්විය යුතුය. ඒ අනුව 2026 වසරේ අයවැය මෙම මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය 2026 සඳහන් මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවේ සඳහන් කර ඇති සීමාවන්ට යටත්ව සකසන ලදී. මෙහිදී යම් හේතුවක් මත රාජ්‍ය මූල්‍ය විවිලාන්හි තත්‍ය අගයන් පුරෝකථනය කල අගයන්ට වඩා සැලකිය යුතු අපගමනයන් දක්වන්නේ නම් ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට කරුණු දැක්විය යුතුය. එමෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ රජය එළඹ ඇති එකඟතාවයන්ට අනුව වැඩසටහන් කාලරාමුව තුළ ශ්‍රී ලංකාව ළඟා කර ගත යුතු රාජ්‍ය ආදායම් ඉලක්ක මෙන්ම අනෙකුත් රාජ්‍ය මූල්‍ය සංරචක ආශ්‍රිත ඉලක්ක ද පැහැදිලිව දක්වා ඇත. ඒ අනුව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ සඳහන් නීතිමය ප්‍රතිපාදන යටතේ මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එළඹ ඇති එකඟතාවයන්ට යටත්ව මෙහි සඳහන් පරිදි රාජ්‍ය ආයතනවල ආදායම් ඇස්තමේන්තු පසුව සංශෝධනය කිරීමට පෙර එහි ප්‍රතිඵලයක් ලෙස සපුරාගත යුතු රාජ්‍ය ආදායම් ඉලක්කවලින් අපගමනය වීමට අවස්ථාවක් නොපවතී.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 488 සඳහා ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

ඒ.කේ.ගුණසේකර

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : **488**

දෙපාර්තමේන්තුවේ නම : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ඉණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

අංකය	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශ	ආයතනය විසින් නිර්දේශ සඳහා ගනු ලැබූ පියවර / වර්තමාන තත්ත්වය
06	ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව හරහා උපයාගනු ලබන රාජ්‍ය ආදායම වැඩිකර ගැනීමට වෙන්වූ ඒකකයක් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ පරිපාලනය යටතේ වෙනම පිහිටුවීම.	මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයට අනුකූලව ආදායම් ක්‍රමෝපාය සම්පාදනය කිරීම හා වැඩිදියුණු කිරීම සහ ආදායම් උපදවන රාජ්‍ය අස්ථිතිවයන්ට උපායමාර්ගික උපදෙස් ලබාදීමේ අරමුණින් 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 8 (2) වගන්තිය අනුව ආදායම් කළමනාකරණ කමිටුව ස්ථාපනය කර ඇති අතර එය පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත වේ. (අ) නිල බලයෙන් පත්වන සාමාජිකයින් i. සභාපතිවරයා විය යුතු භාණ්ඩාගාරයේ ලේකම්වරයා ii. මූල්‍ය ප්‍රතිපත්ති විෂයය භාරව සිටින භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා iii. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා iv. රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා v. සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා vi. භාණ්ඩාගාර මෙහෙයුම් විෂයය භාරව ඇති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා vii. මූල්‍ය ප්‍රතිපත්ති විෂයය භාරව ඇති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා (ආ) ආදායම් කළමනාකරණය පිළිබඳ විෂයය ක්ෂේත්‍රයේ නිපුණත්වයක් සහිත තැනැත්තන් අතරින් මුදල් අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන වෙනත් සාමාජිකයන් දෙදෙනෙක්. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුව ආදායම් කළමනාකරණ කමිටුවේ ලේකම්වරයා ලෙස භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නම්කරනු ලබන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයකු කටයුතු කරනු ලබයි. තවද, රාජ්‍ය ආදායම ඉහළ නංවාගැනීම සඳහා ආදායම් කළමනාකරණ කමිටුව විසින් පහත සඳහන් පුළුල් උපායමාර්ගික සැලසුම් අනුගමනය කිරීමට නියමිතය. • රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශය ද නියෝජනය කරමින් ආදායම් කළමනාකරණ කමිටුව මඟින් උපායමාර්ගික ලෙස රාජ්‍ය ආදායම ඉහළ නැංවීමට අදාළව යෝජනා කැඳවීමටත් එම යෝජනා ආශ්‍රිතව මධ්‍යකාලීන ආදායම් උපායමාර්ගයක් සැකසීමටත් අපේක්ෂා කෙරේ.

		• ඒ අනුව සකසනු ලබන මධ්‍ය කාලීන ආදායම් උපායමාර්ග ක්‍රියාකාරී සැලැස්ම ආදායම් කළමනාකරණ කමිටුව මඟින් අධීක්ෂණය කිරීමට නියමිතය. • මධ්‍ය කාලීන ආදායම් උපායමාර්ග තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් 2026 ජූලි මාසයේදී තාක්ෂණික සහයෝගීතාවය ලබා ගැනීමට සැලසුම්කර ඇති අතර එමඟින් රාජ්‍ය ආදායම තවදුරටත් ශක්තිමත් කිරීමට පියවර ගනු ඇත. ඊට අමතරව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව තුළ බදු ප්‍රතිපත්ති විශ්ලේෂණ ඒකකයක් ස්ථාපිත කර ඇති අතර එමඟින් ආදායම් විශ්ලේෂණය, බදු ප්‍රතිපත්තිවල ආර්ථික හා බෙදීයාමේ විශ්ලේෂණය, බදු අහිමිවීම් ඇගයීම, සාක්ෂි මත පදනම් වූ බදු විශ්ලේෂණය සහ ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේද හරහා බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සැලසුම් කිරීම, තක්සේරු කිරීම සහ අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි. තවද, ආදායම් කළමනාකරණ චක්‍රලේඛය අනුව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් මාසික, කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික ආදායම් පිළිබඳ වාර්තා ලබාගැනීම හරහා අදාළ ආයතනවල ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය අධීක්ෂණය කරනු ලබයි. එමෙන්ම, මාසිකව පවත්වනු ලබන මුදල් ප්‍රවාහ සමාලෝචන රැස්වීම් සඳහා ද මෙම ආදායම් එකතු කරනු ලබන ප්‍රධාන ආයතන සම්බන්ධ වේ මෙම ක්‍රියාමාර්ග තුළින් ආදායම් උපදවනු ලබන ප්‍රධාන ආයතනවල කාර්යසාධනය නිරන්තර සමාලෝචනයට භාජනය වේ. ඉහත සඳහන් ක්‍රියාමාර්ග හා කමිටු හරහා අනුගමනය කරන ලද බදු පරිපාලන ප්‍රතිසංස්කරණ හා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා උපායමාර්ග හරහා රාජ්‍ය ආදායම 2025 වසරේදී අපේක්ෂිත අගයට වඩා ඉහළ කාර්යසාධනයක් ළඟාකර ගැනීමට සමත්ව ඇත. ඒ අනුව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පිහිටුවීමට නිර්දේශ කරන ලද පරිපාලන ඒකකය තුළින් ලඟාකර ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටුවන බැවින් තවදුරටත් වෙනත් ඒකකයක් පිහිටුවීමේ අවශ්‍යතාවයක් නොමැති බව නිරීක්ෂණය වේ.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 488 සඳහා ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

ආචාර්ය එම්.කේ.සී සේනානායක
අධ්‍යක්ෂ ජනරාල්

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : **488**

දෙපාර්තමේන්තුවේ නම : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

අංකය	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් ලබාදුන් නිර්දේශ	ආයතනය විසින් නිර්දේශ සඳහා ගනු ලැබූ පියවර/වර්තමාන තත්ත්වය
01	ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතන වල රාජ්‍ය ආදායම වර්ධනය කර ගැනීමට අවශ්‍ය යෝජනාවලියක් සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් කාරක සභාව වෙත ලබාදෙන ලෙස කාරක සභාව විසින් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ නිලධාරී (ග.නි.) වෙත නිර්දේශ කර තිබුණද ශ්‍රී ලංකා රේගුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ආදායම වර්ධනය කර ගැනීමේ යෝජනාවක් පමණක් ඉදිරිපත් කර තිබූ අතර සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ආදායම වර්ධනය කර ගැනීමේ යෝජනාවලියක් මෙන්ම ක්‍රියාකාරී සැලැස්මක්ද ඉදිරිපත් කර ඇති බව කාරක සභාව නිරීක්ෂණය කලේය. අදාළ ආයතන තුන විසින් ලබා දී ඇති යෝජනාවලි ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් වැඩ පිළිවෙලක් සකස් කරමින් පවතින බවත් හඳුනාගත් ක්‍රියාකාරී සැලසුම් වල ඇති යෝජනා, පාර්ශවයන් අතර එකඟතාවයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා	ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතන රැස් කරන ආදායම වැඩි කිරීම තුළින් රාජ්‍ය ආදායම වර්ධනය කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූලික කාර්ය භාරයක් වන අතර වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුවට අදාළව ඊට සහාය වීම සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ආදායම් වර්ධනය කිරීමේ දිගු කාලීන උපාය මාර්ගික වැඩසටහනක් ලෙස වෙළඳ ජාතික වෙළඳ තනි කවුළු ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාර්යාලය ක්‍රියාත්මක කිරීමේ ඒකකය 2024 ඔක්තෝබර් මාසයේදී ස්ථාපනය කළ අතර මේ වන විට සැළසුම් කළ පරිදි අදාළ පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී. වෙළඳ ජාතික තනි කවුළු ව්‍යාපෘතිය මගින් සිදු කෙරෙන්නේ ආනයන අපනයන වෙළඳාමේ නිරත වන වෙළඳුන් විසින් එකී ක්‍රියාවලියේදී ලබාගත යුතු අනුමැතීන් ,බලපත්‍ර, සහතික ආදිය තනි ඩිජිටල් කවුළුවක් වෙත එක් වරක් ප්‍රවේශ වී දත්ත ඇතුළත් කිරීම මගින් කඩිනමින් සපුරා ගැනීමට පහසුකම් සැලසීමයි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කළ පසු ආනයන අපනයන වෙළඳාම් කටයුතු පහසු හා කාර්යක්ෂම වන බැවින් එය වෙළඳ පරිමාව වැඩි වීමටත් ඒ අනුව රේගු ආදායම ඉහළ යාමටත් හේතු වේ. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් මෙම වෙළඳ ජාතික තනි කවුළු ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන්නේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසිනි. එමෙන්ම ජාතික වෙළඳ පහසුකරණ කමිටුව, ලෝක වෙළඳ සංවිධානයේ (WTO) වෙළඳ පහසුකරණ ගිවිසුමට (TFA) අනුකූලව ශ්‍රී ලංකාව විසින් මේ වන විට පිහිටුවා ඇති අතර එහි අරමුණු වන්නේ වෙළඳාමට අදාළ ක්‍රියාපටිපාටීන් සරල කිරීම, නවීකරණය කිරීම, විවිධ රජයේ ආයතන අතර සම්බන්ධීකරණය ඇති කිරීම, වෙළඳාමේදී ඇතිවන බාධා හඳුනා ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සහ වෙළඳාමට අදාළ තොරතුරු විනිවිදභාවයකින් යුතුව ලබාදීම සහතික කිරීම.ආදිය වේ. මේ අනුව ජාතික වෙළඳ පහසුකරණ කමිටු ලේකම් කාර්යාලය ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත

	කරන බවත් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. කාරක සභාවට දන්වා සිටියේය.	කර ඇත. මෙම කමිටුවට රේගුව, වාණිජ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය වැනි රාජ්‍ය ආයතන මෙන්ම පෞද්ගලික අංශයේ නියෝජිතයෝ ද ඇතුළත් වේ. මේ කමිටුවේ කාර්ය භාරය මගින්ද වෙළඳ පරිමාව ඉහළ යන අතර එය දිගු කාලීනව රේගු ආදායම් වර්ධනය වීමට ඉවහල් වේ. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් මෙම ජාතික වෙළඳ පහසුකරණ කමිටුවට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන්නේද වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසිනි.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 488 සඳහා ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 488

දෙපාර්තමේන්තුවේ නම : තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

අංකය	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් ලබාදුන් නිර්දේශ	ආයතනය විසින් නිර්දේශ සඳහා ගනු ලැබූ පියවර/වර්තමාන තත්ත්වය
05	රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය නොකිරීම නිසා ඇතිවන ගැටලු පිළිබඳව අවධානය යොමු කල කාරක සභාව, රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය. එහි දී අදාළ දත්ත පද්ධති සකස් කර ගැනීම සඳහා සුදුසු පුද්ගලයන්/ආයතන දැන්වීම් පළ කිරීම හරහා තෝරා ගන්නා ලෙසත් උපයන ආදායමෙන් ප්‍රතිශතයක් ඔවුන්ගේ සේවා ගාස්තු ලෙස ගෙවීමට කටයුතු කරන ලෙස කාරක සභාව නිර්දේශ කළේය. මේ වන විට ඒ සඳහා යෝජනා (EOI- expression of interest) කැඳවීමට තීරණය කර ඇති බව මුදල් ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි. ප්‍රකාශ කළේය.	භාණ්ඩාගාරයේ ඒ ඒ දෙපාර්තමේන්තු වල පද්ධති සංවර්ධනය සඳහා දැන්වීම් පල කිරීම මගින් බාහිර ආයතන හරහා සුදුසු පුද්ගලයින් තෝරාගෙන ඇති අතර යම් දෙපාර්තමේන්තු සඳහා පද්ධති එලෙස ලබා ගන්නා තෙක් මේ සම්බන්ධයෙන් වී ඇති පමාවන් අවම කරවා ගැනීමට අතුරු විසඳුමක් ලෙස භාණ්ඩාගාරයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් පද්ධති සංවර්ධනය කර ලබා දුන් අතර මානව සම්පත් ගැටළු ආදිය හේතුවෙන් මේ වන විට භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් මත GovTech Sri Lanka (Pvt) Ltd ආයතනයේ සහය එම කාර්යය සඳහා ලබා ගැනීමට කටයුතු කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 488 සඳහා ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

ජේ.එච්.එස්.පී.ජයමහ
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මූල්‍ය),
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට,
තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව.
2026.07.08.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 488

දෙපාර්තමේන්තුවේ නම : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

අංකය	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් ලබාදුන් නිර්දේශ	ආයතනය විසින් නිර්දේශ සඳහා ගනු ලැබූ පියවර /වර්තමාන තත්වය
01	<u>රාජ්‍ය ආදායම් වර්ධනය කර ගැනීම සඳහා යෝජනාවලියක් ඉදිරිපත් කිරීම</u> ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතන වල රාජ්‍ය ආදායම වර්ධනය කර ගැනීමට අවශ්‍ය යෝජනාවලියක් සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් කාරක සභාව වෙත ලබාදෙන ලෙස කාරක සභාව විසින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි) ගණන් දීමේ නිලධාරී (ග.නි) වෙත නිර්දේශ කර තිබුණද ශ්‍රී ලංකා රේගුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ආදායම වර්ධන කර ගැනීමේ යෝජනාවන් පමණක් ඉදිරිපත් කර තිබූ අතර සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ආදායම වර්ධනය කර ගැනීමේ යෝජනාවලියක් මෙන් ම ක්‍රියාකාරී සැලැස්මක්ද ඉදිරිපත් කර ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළේය. අදාල ආයතන තුන විසින් ලබා දී ඇති යෝජනාවලි ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් වැඩපිළිවෙළක් සකස් කරමින් පවතින බවත් හඳුනාගත් ක්‍රියාකාරී සැලසුම් වල ඇති යෝජනා , පාර්ශවයන් අතර එකඟතාවයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බවත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ ග.නි කාරක සභාවට දන්වා සිටියේය.	ඇමුණුම 01 බලන්න
04	<u>තාවකාලික එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචිය පිළිබඳ වර්තමාන තත්වය</u> - මේ සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ සභාපතිත්වයෙන් කමිටුවක් පත් කළ බවත්;	01. තාවකාලික වැට් බදු ලියාපදිංචි සහතිකය සඳහා QR කේතයන් ඇතුලත් කිරීම වෙනුවට, තාවකාලික ලියාපදිංචිය ඉල්ලා සිටීමට පාදක වන ඉන්වොයිස් පත්‍රයේ අංකය සහ නැව්භාර පත්‍රයේ (Bill of

	• එම කමිටුව විසින් නිර්දේශ 08 ක් ලබාදී ඇති බව හා ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් විසින් ශ්‍රී ලංකා රේගුවට සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දී ඇති බවත්; • ඇතැම් නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කර ඇති බවත්; සහ • ස්ථිර VAT බදු ලියාපදිංචිය ඇති පාර්ශවයන්ට තාවකාලික VAT අංක ලබා නොදෙන බවත් , මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ ග.නි ප්‍රකාශ කළේය. <u>නිරීක්ෂණ/ නිර්දේශ</u> තාවකාලික වැට් බදු ලියාපදිංචියට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුවට දත්ත හුවමාරු කර ගත හැකි වන පරිදි සත්‍යාපනය කළ හැකි QR කේතයක් (Verifiable QR Code) යොදා ගැනීමට පියවර ගැනීම සුදුසු බව කාරක සභාව යෝජනා කළේය. තාවකාලික වැට් බදු ලියාපදිංචිය බොහෝ වංචාවන්ට හේතු වී ඇති බැවින් එම තත්වය වළක්වා ගැනීම සඳහා තාවකාලික වැට් බදු ලියාපදිංචිය අහෝසි කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළ කාරක සභාව ඒ සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතීන් ඇතුළු අනෙකුත් නෛතික අවශ්‍යතාවයන් ඉටුකර ගන්නා ලෙසත්, මෙම නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් 2024.05.27 වන දිනට පෙර ලිඛිත වාර්තාවක් කාරක සභාව වෙත ලබාදෙන ලෙසත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත නිර්දේශ කරන ලදි. මේ සම්බන්ධව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MF06/04/COPA Genera 2022 හා 2024.06.07 දිනැති ලිපියෙන් සහ අංක MF06/04/COPA Genera 2023 – Vol-iii හා 2024.07.19 සහ 2024.07.22 දිනැති ලිපි මඟින් වාර්තා කර ඇත. මෙම කාරක සභාව නැවත ඉදිරි දිනෙක කැඳවන බැවින් එදිනට, තාවකාලික වැට් බදු ලියාපදිංචිය හේතුවෙන් ඇතිවන ගැටලුකාරී තත්ත්වය වළක්වා	Lading) අංකය ඇතුළත් කිරීම මගින් තාවකාලික ලියාපදිංචිය එම කාරණය සඳහාම පමණක් සීමා කිරීම. 02. 2025 අංක 04 දරණ එකතු කළ අගය මත බදු සංශෝධන පනත මගින් නැවත විකිණීමේ අරමුණින් (Commercial Purpose) භාණ්ඩ ආනයනය කිරීම හෝ භාණ්ඩ අපනයනය කිරීම සඳහා එකතු කළ අගය මත බදු ස්ථිර ලියාපදිංචිය අනිවාර්ය කිරීම. මෙමඟින් , තාවකාලික එකතු කළ අගය මත බදු ලියාපදිංචිය තමාගේ පෞද්ගලික භාණ්ඩයක් ආනයන/ අපනයනය කිරීම හෝ තමාගේ ව්‍යාපාරයට අදාල ප්‍රාග්ධන භාණ්ඩයක් ආනයනය කිරීම යනාදී කාරණා වලට පමණක් සීමාවිය. 03. ඇමුණුම 02 බලන්න.

	ගැනීමට අවශ්‍ය මාර්ගගත (online) වැඩපිළිවෙලක් සකසා (දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකා රේගුවට අදාළ වන ලෙස) එය ක්‍රියාත්මක කිරීම පිළිබඳව පරිගණක දෘෂ්‍ය ඉදිරිපත් කිරීමක් (Computer Presentation) සිදුකරන ලෙස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත වැඩිදුරටත් නිර්දේශ කරන ලදි.	
06	<u>මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා අදාළ ආයතන අතර සම්බන්ධීකරණයේ දුර්වලතා</u> <u>නිරීක්ෂණ / නිර්දේශ</u> රජයට අයකර ගත හැකි රාජ්‍ය ආදායමෙන් මේ වන විට අයකර ගනු ලබනුයේ 1/3 ක ප්‍රමාණයක් බවත්, 2/3 ක ආදායමක් අයකර ගැනීමට නොහැකි වී ඇති බවත් පෙන්වා දුන් කාරක සභාව , එකතු කළ හැකි සම්පූර්ණ රාජ්‍ය ආදායම අයකර ගත හැකි ප්‍රායෝගික වැඩපිළිවෙළක් මුදල් , ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් සකස් කළ යුතු බව අවධාරණය කළේය. එසේම, රාජ්‍ය ආදායමෙන් වැඩිම ප්‍රතිශතයක් සඳහා දායකත්වය සපයනු ලබන ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව සමඟ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය අතර සම්බන්ධීකරණයේ දුර්වලතා ඇති බව කාරක සභාව විසින් දිගින් දිගටම පෙන්වා දෙනු ලැබූ අතර , මෙම ආයතන තුන හරහා උපයා ගනු ලබන රාජ්‍ය ආදායම වැඩිකර ගැනීමට වෙන්වූ ඒකකයක් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ පරිපාලනය යටතේ පිහිටුවීමේ වැදගත්කම කාරක සභාව විසින් අවධාරණය කරන ලදි.	මුදල් ආර්ථික ස්ථායිතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා අදාල ආයතන අතර සම්බන්ධීකරණ දුර්වලතා නියාමනය සඳහා රාජ්‍ය ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණ සහ නවීකරණ අංශයක් ජනාධිපති ලේකම් කාර්යාලයේ ස්ථාපිත කර ඇත.
11	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS දත්ත පද්ධතිය (Revenue Administration Management Information System) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS දත්ත පද්ධතිය භාර ගැනීමට කාර්ය මණ්ඩලය බදවා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් නඩත්තු සහ සේවා සඳහා ගිවිසුම තවත් අවුරුදු 03 කට දීර්ඝ කිරීම සඳහා සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය 2024 අප්‍රේල්	I. RAMIS පද්ධතිය නඩත්තු කිරීමට , පද්ධතියේ නිර්මාණකරු වන Singapore Corporation Enterprise (SCE) ආයතනය සමඟ 2024.02.01 දින සිට 2027.01.31 දක්වා වසර 03 සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත නඩත්තු ගිවිසුමකට එළඹ ඇත. එම නඩත්තු ගිවිසුම ප්‍රකාරව RAMIS පද්ධතිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම සඳහා වන යෝජනාවලිය මුදල්

	30 දින ලැබී ඇති බව කාරක සභාව හමුවේ අනාවරණය විය. **නිරීක්ෂණ / නිර්දේශ** • මේ සඳහා සිංගප්පූරු ඩොලර් 31,808,289 (බදු රහිත) නොඉක්මවන පිරිවැයක් දැරීමට සිදුවන බව කාරක සභාව නිරීක්ෂණය කළේය. • එම අවුරුදු 03 ඉක්මයාමෙන් පසු හෝ මෙම පද්ධතිය භාරගෙන පවත්වාගෙන යාමට හැකිවන සේ අවශ්‍ය කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට පියවර ගෙන තිබේද යන්න පිළිබඳව කාරන සභාවේ අවධානය යොමු විය. • එසේම RAMIS දත්ත පද්ධතිය අවසන් කිරීමට අපේක්ෂිත මුදලට වඩා ඉතා අධික මුදලක් වැයකර තිබුණ ද මේ වන විටත් එය නිසි ලෙස ක්‍රියාත්මක කළ නොහැකි වීම පිළිබඳව කාරක සභාව සිය කණස්සල්ල පළ කළේය. • RAMIS දත්ත පද්ධතියට අදාළව ඇමතුම් මධ්‍යස්ථානය (Call Center) පවා බාහිර පාර්ශවයක් වෙත ලබා දීමත්, මෙම දත්ත පද්ධතියට අදාළ ගිවිසුම තුන්වැනි පාර්ශවයකට පරීක්ෂාකර බැලීමට අවකාශය නොමැති බවත් කාරක සභාවේදී අණාවරණය විය. • මෙම දත්ත පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සාම්ප්‍රදායික ක්‍රම වලින් බැහැරව ප්‍රසිද්ධ දැන්වීමක් හරහා සුදුසුකම්ලත් ආයතනයක සහාය ලබාගනිමින් රටට ගැලපෙන ලෙස දත්ත පද්ධතිය සකසා ගැනීමත්, අදාළ සේවා ගාස්තු, ආදායම ඉහළ නැංවීමෙන් ලැබෙන ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස ගෙවීමට කටයුතු කිරීමත් වඩා යෝග්‍ය බව කාරක සභාව පෙන්වා දුන්නේය	අමාත්‍යාංශය වෙත 2024.11.06 දින ඉදිරිපත් කරන ලදි. තවද , මෙම පවරා ගැනීම් සැලැස්ම සමාලෝචනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් (ආයතනික) විසින් පත් කරන ලද කමිටුවේ වාර්තාව මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව මෙම වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා 2025/09/08 දින කැබිනට් අනුමැතිය ලැබී ඇත. II. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අංක MF/088/CM/2025/221 (ඇමුණුම 03) සහ 2025.08.24 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා 2025.09.08 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතීත්වයෙන්, මතුවිය හැකි මානව සම්පත් සීමාවන් අවබෝධ කරගනිමින් යෝජිත පවරාගැනීමේ සැලැස්මේ ශක්‍යතා ඇගයීම් සඳහා සාමාජිකයින් 10 දෙනකුගෙන් යුත් කමිටුවක් 2025.11.17 දින පත්කරන ලදී. මෙම කමිටුව විසින් සකස්කරන ලද වාර්තාව 2026.01.08 දින මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත ඉදිරිපත් කරන ලදී. III. ඉහත අමාත්‍ය මණ්ඩල නිර්දේශයන්ට අනුව පවරා ගැනීමේ සැලැස්ම ආරම්භ කිරීමට පෙර ක්‍රියාකාරී වගකීම්, මූල්‍ය බැඳීම් පිළිබඳව ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වරයාගේ සහ අදාල අමාත්‍යාංශ ලේකම් වරුන් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම කල යුතු වේ. මෙම අවබෝධතා ගිවිසුමෙහි කෙටුම්පත නීති නිෂ්කාශන කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශය වෙත 2026.04.27 දින යොමු කරන ලදි. IV. පවරා ගැනීම ආරම්භ කිරීමට පෙර RAMIS පද්ධතිය පිළිබඳ පූර්ණ

		අවබෝධයක් ලබා ගැනීම සහ , පවරා ගැනීමේ සැලැස්ම පිළිබඳ නිර්දේශ ලබා ගැනීම සඳහා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ උපදේශකයකු සහ ජනාධිපති ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයෙකු / Gov Tech Sri Lanka Pvt ආයතනයේ තොරතුරු තාක්ෂණය පිළිබඳ විශේෂඥ දැනුමැති නිලධාරීන් දෙදෙනෙකු 2026.02.26 දින නම් කරන ලදී. ඒ අනුව ඔවුන් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, මොරටුව විශ්ව විද්‍යාලය සහ SCE/NCS (Pvt) Ltd ආයතන සමඟ සාකච්ඡා පවත්වන ලදී. ඔවුන් විසින් RAMIS පද්ධතිය පවරා ගැනීමේ සැලැස්ම සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට නියමිත වේ.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 488 සඳහා ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

කොමසාරිස් ජනරාල්

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

ඇමුණුම 01

9. බදු පරිපාලනය ශක්තිමත් කිරීම (දේශීය ආදායම් දෙපාර්තමේන්තුව).

යෝජනා	කාල රාමුව			ප්‍රගතිය
	2024	2025	2026	
ඉදිරි වසර දෙක තුළ ඇතිවන පුරප්පාඩු ද ඇතුළත්ව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වහාම පිරවීම.	1	2	3	1. වර්ෂය තුළ සහකාර කොමසාරිස්වරු 57 දෙනෙකු බඳවා ගෙන ඇත. 2. වර්ෂය තුළ සහකාර කොමසාරිස්වරු 98 දෙනෙකු බඳවා ගෙන ඇත. 3. සහකාර කොමසාරිස්වරු 200 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිලධාරීන්ට ප්‍රමාණවත් කාර්ය මණ්ඩල පුහුණු පහසුකම් සැපයීම (මෑතකාලීන බදු නීති සංශෝධන, ජාත්‍යන්තර බදු, ඩිජිටල් සේවා සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත වත්මන් ප්‍රවණතා, බදු මගහැරීම් සහ බදු ගෙවීම් පැහැර හැරීම් වලට එරෙහිව ක්‍රියා කරන ආකාරය ආදිය).				1.විදේශ පුහුණු අවස්ථා 2023-47 2024- 50 2025- 41 2.දේශීය පුහුණු අවස්ථා 2024- 26 2025- 12 3. දෙපාර්තමේන්තුගත පුහුණු අවස්ථා • වර්ෂයක් සඳහා පැය 12 බැගින් සියළු නිලධාරින සඳහා පුහුණු අවස්ථා ලබා දීම • බඳවා ගන්නා ලද නව නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩයිම් විභාග සඳහා දේශන මාලාවක් පැවැත්වීම 2024- 536 2025- 576
